**ආරක්ෂක අමාත්‍යාංශය.**

**තුවක්කු අඥා පනතේ 15 වැනි වගන්තියට අනුව**

**ගිනිඅවි පැවරීමක් සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන.**

(**"කෘෂිකාර්මික කාර්යයක්"**වෙනුවෙන් සන්තකයේ තබාගෙන පාවිච්චි කරනු ලබන ගිනිඅවියක් සඳහා)

අවශ්‍ය ලේඛන

01. සම්පූර්ණ කරන ලද ගිනිඅවි පැවරීමේ ඉල්ලුම් පත හා සත්‍ය පිටපතක් ලෙස සහතික කරන ලද ජාතික හැඳුනුම්පත්වල ඡායා පිටපත්. (පැවරුම්කරුගේ සහ පැවරුම්ලාභියාගේ)

02. පැවරුම්ලාභියාගේ උප්පැන්න සහතිකයේ හා විවාහ සහතිකයේ මුල් පිටපත්.

03. අවසානවරට ලබාගත් ගිනිඅවි බලපත්‍රයේ ඡායා පිටපතක් (පවත්නා වර්ෂයේ ගිනිඅවි බලපත්‍රය අලුත් කර ඇත්නම් එහි ඡායා පිටපතක්/අලුත් කර නොමැති නම් ගිනිඅවිය පොලීසියට භාරගත් බවට ලිපිය).

04. ගිනිඅවිය මිලදී ගැනීමේ අවසර පත්‍රයේ පිටපතක්

05. ගිනිඅවිය සඳහා මුල් වරට ලබාගත් බලපත්‍රයේ පිටපතක්

06. කෘෂිකාර්මික ඉඩම් ඔප්පුවල සහතික කරන ලද පිටපත් හා ඊට අදාළ පත්ඉරු. (පත්ඉරු මාස 06ක් ඇතුළත ලබාගත් ඒවා විය යුතුය.)

07. පැවරුම්ලාභියා සතුව අවම ඉඩම් ප්‍රමාණය අක්කර 02 ක් විය යුතුය. මෙම ඉඩම් එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ පිහිටා තිබේද යන්න පිළිබඳ ප්‍රාදේශිය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී වාර්තාවක් මගින් තහවුරු කළ යුතුය.

08. ඉහත 4 න් ඉදිරිපත් කරන ඔප්පුවලට අයත් ඉඩම්වල ඇති වගාවන් මොනවා ද? ඒවා කොපමණ ප්‍රමාණයකින් යුක්ත ද? එම වගාවන්ට සිදුවන හානි පිළිබඳව කරුණු ඇතුළත් දිස්ත්‍රික් ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙතින් ලබාගත් සහතිකයක්.

09. ගිනිඅවි හිමිකරු මියගොස් ඇත්නම් ඔහුගේ / ඇයගේ මරණ සහතිකයේ මුල් පිටපත.

10. පැවරුම්ලාභියා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සමාජිකයෙකු නම්, ගිනිඅවිය පැවරීම පිළිබඳව සේවය කරන ආයතනයේ ප්‍රධානියාගෙන් ලබා ගත් එකඟතා ලිපියක්.

11. ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ආදායම් තක්සේරු කිරීමේ ආකෘති පත්‍රය. (පැවරුම්කරු හෝ පැවරුම්ලාභියා නමින්- අවම වාර්ෂික ආදායම රු.400,000.00කට නොඅඩු විය යුතුය.)

12. පැවරුම්ලාභියා හැර පවුලේ වෙනත් දරුවන් සිටීනම් ගිනිඅවිය පැවරුම්ලාභියාට ලබාදීම පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත දක්වන දිවුරුම් ප්‍රකාශ.

13. පවුලේ සාමාජික සංඛ්‍යාව ඇතුළත් පවුලේ විස්තර සහිත ග්‍රාම නිලධාරී වාර්තාව. (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුයි)

- ❖ දිවුරුම් ප්‍රකාශ /ප්‍රතිඥා එවීමේදී පවතින නෛතික විධිවිධාන ප්‍රකාරව නියමිත වටිනාකම් සහිත මුද්දර මත අත්සන් කර තිබිය යුතුවේ.

<u>**ආරක්ෂක අමාත්‍යාංශය.**</u>

<u>**තුවක්කු අඥා පනතේ 15 වැනි වගන්තියට අනුව**</u>

<u>**ගිනිඅවි පැවරීමක් සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන.**</u>

(**"කෘෂිකාර්මික නොවන කාර්යයක්"** වෙනුවෙන් සන්තකයේ තබාගෙන පාවිච්චි කරනු ලබන ගිනිඅවියක් සඳහා)

<u>අවශ්‍ය ලේඛන</u>

01. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය හා පැවරුම්කරුගේ / පැවරුම්ලාභියගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්

02. පැවරුම්කරුගේ හා පැවරුම්ලාභියා අතර, ඥාතීත්වය තහවුරු කරන ලේඛණ (උප්පැන්න සහතිකයේ / විවාහ සහතිකයේ ඡයා පිටපත්)

03. අවසාන වරට ලබාගත් ගිනිඅවි බලපත්‍රයේ ඡයා පිටපතක්

04. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡයා පිටපතක්.

05. දේපල සහ වත්කම් පිළිබඳව වූ ලිපිලේඛන වල ඡයා පිටපත් (ඔප්පු, කුලි ගෙවීම්..... පත්තිරු)

06. සොරකම් හෝ මංකොල්ලකෑම් පිළිබඳ හෝ මරණ තර්ජන පිළිබඳ ඔබ විසින් කරන ලද පොලිස් පැමිණිලි වී නම් ඒවායේ පිටපත් හා පොලිස් වාර්තා

07. පසුගිය වර්ෂ 3 හි ආදායම් බදු ගෙවීමට අදාල දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ලේඛනවල සහතික කරන ලද ඡයාපිටපතක්.

08. ව්‍යාපාර සේවකයන් සම්බන්ධව සේවක අර්ථ සාධක අරමුදල් හා සේව නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවූ ගෙවීම් පත්‍රිකා වල ඡායා පිටපත

09. දෛනික මුදල් ප්‍රවාහන කටයුතු හා තැන්පතු පිළිබඳව බැංකු පත්‍රිකා වල ඡායා පිටපත්

- සහතික වල ඡායා පිටපත් එවීමේදී සත්‍ය පිටපත් බවට සමාදාන විනිශ්චයකාරවරයකු ලවා සහතික කර තිබිය යුතුවේ.

- දිවුරුම් ප්‍රකාශ / ප්‍රතිඥා එවීමේදී පවතින නෛතික විධිවිධාන ප්‍රකාරව නියමිත වටිනාකම් සහිත මුද්දර මත අත්සන් කර තිබිය යුතුවේ.